**ගලිගමුව ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 30 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදි මිලදී ගෙන තිබූ රු. 208,031 ක් වටිනා පුස්තකාල පොත්වලින් රු.186,000 ක් වටිනා පොත් පමණක් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලද වට්ටම් වෙනුවෙන්ද පුස්තකාල පොත් මිලදී ගෙන ඇති බැවින් පුස්තකාල පොත් නියම වටිනාකමින් දක්වා ඇත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන/වාර්තාවල දැක්වෙන ශේෂය අතර රු. 5,411,893 ක වෙනසක් විය. | ලේඛණ නිවැරදි විය යුතුයි. | පළාත් පාලන අමාත්‍යාශය මගින් පරිත්‍යාග ලෙස ලැබුණු බැකෝ ලෝඩරය නැවතත් එම අමාත්‍යාංශය වෙත ආපසු භාර දී ඇත. එම වටිනාකම් ලේඛණවලින් ඉවත් කර ලේඛණ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට මුදල් , මුදල් හා සමාන දෑ යටතේ දක්වා තිබූ මහජන | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | මෙහිදී රු.168,830 ක් වටිනා චෙක්පත් 03 ක් මුදල් පොතේ සටහන්ව එම වටිනාකම් ගැලපීමෙන් නිවැරදිව බැංකු සැසඳුම |

| | |
|---|---|
| බැංකුවේ සේවක ණය ගිණුමේ ශේෂය මුදල් පොත අනුව රු.266,234 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.97,404 ක් ලෙස දක්වා තිබුණි. | පිළියෙල කර ඇතත්, එය බැංකු සැසඳුම සකස් කිරීමේදී අතපසුවීමකින් සිදු වූවක් බැවින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 | වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ වරිපනම් හා අක්කර බදු රු.121,001 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | වර්ෂයක කාලයක් ඉක්මවූ රු. 121,001 ක හිඟ වරිපනම් හා අක්කර බදු අය කිරීම සඳහා ආදායම් පරීක්ෂකවරුන් හට සැලැස්මක් සකස් කර ලබා දී ඇති අතර ඔවුන් මේ වන විට එම සැලැස්ම අනුව කටයුතු කරමින් සිටී. |
| (ආ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ ප්‍රකාශිත 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය. | පරිසරයට අපද්‍රව්‍ය මුදාහරිමින් පවත්වා ගෙන යනු ලබන කර්මාන්ත 32 කට පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පනතේ විධිවිධානප්‍රකාරව කටයුතු කළ යුතුය. | පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාරිකයින් හට දැනුවත් කිරීමේ ලිපි මේ වන විට නිකුත් කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල රු. 83,412 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | චෙක්පත් සියල්ල මේ වන විට ඉවත් කිරීමට කටයුතු කර ඇත. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 2010 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ රු. 779,978 ක තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | පොදු තැන්පත් වල ඇති රු.726,978.73 ක කර්මාන්ත ලැබීම් වලට අදාල කර්මාන්ත කටයුතු නිසි ලෙස අවසන් කර නොමැත. එම නිසා එම මුදල් ප්‍රදානය කල ආයතනය වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නැවත ගෙවීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| | (iii) මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 21 ක 2015 ඔක්තෝබර් සිට ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 ඡේදය | වසර 05 කට වරක් සිදු කළ යුතු වරිපනම් තක්සේරුව 2009 වර්ෂයෙන් පසුව සිදු නොකිරීම හේතුවෙන් සංවර්ධන කාර්යයන් මත වාර්ෂික වටිනාකම වැඩිවන දේපලවලින් සභාවට අයකරගත හැකිව තිබුණු ආදායම් අහිමි වී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2014 වර්ෂයේ සිට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වරිපනම් තක්සේරුවක් සඳහා විටින් විට ඉල්ලීම් සිදු කරන්නට යෙදුණි. එයට ප්‍රතිචාර ලෙස මෙම වසරේදී තක්සේරු කටයුතු සඳහා තක්සේරු නිළධාරීන් පැමිණි අතර එම කටයුතු අවසන් අදියරේ පවතී. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,470,437 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,462,617 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස් කල ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස් කල ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,461,368 | 2,391,123 | 2,276,462 | 488,169 | 2,389,000 | 2,338,024 | 2,370,524 | 423,821 |
| කුලී | 5,614,245 | 5,003,541 | 2,923,622 | 525,146 | 4,483,775 | 3,296,450 | 2,317,060 | 531,671 |
| බලපත්‍ර ගාස්තු | 900,200 | 900,200 | 1,158,566 | 22,250 | 880,200 | 914,870 | 897,233 | - |
| වෙනත් ආදායම් | 15,193,034 | 15,193,034 | 15,048,029 | - | 14,556,000 | 14,556,000 | 15,505,332 | - |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේකම් විසින් ඉදිරිපත් කළ ඉහත ආදායම් වාර්තාවේ සඳහන් බිල්කල ආදායම් මූල්‍ය ප්‍රකාශන වල සඳහන් බිල්කල ආදායම් අතර පහත පරිදී වෙනස්කම් පැවතුණි. | වෙනස්කම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. | වරිපනම් හා බදු , බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් වැඩිවීමට බිල්කල ආදායමට වඩා රැස්කල ආදායම වැඩි වීම හා වර්ෂය අවසානයේදී ලද මුද්දර ගාස්තු ආදායම හේතු වී ඇත. කුළී ආදායම අඩුවීම සඳහා කොටියාකුඹුර ගවමස් කඩ ආදායම අහිමි වීම බලපා ඇත. |

| විස්තරය | ආදායම් වාර්තාව අනුව බිල්කල ආදායම | මූල්‍ය ප්‍රකාශන අනුව බිල්කල ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,391,123 | 2,398,623 | 7,500 |
| කුලී | 5,003,541 | 3,579,392 | 1,424,149 |
| බලපත්‍ර ගාස්තු | 900,200 | 1,176,816 | 276,616 |
| වෙනත් ආදායම් | 15,193,034 | 22,468,908 | 7,275,874 |

2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට මස්කඩ වෙළඳ අයිතිය බදු දීම වෙනුවෙන් රු.2,547,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ නමුත් ඒ සඳහා සුදුසු ස්ථානයක් නොමැතිවීම නිසා රු. 1,846,500 ක ආදායමක් අහිමි වී තිබුණි. | ඇස්මේන්තුගත ආදායම් ලභාකර ගැනීමට කටයුතු කළ යුතුයි. | කොටියාකුඹුර ගවමස් කඩය 2018 ටෙන්ඩර් ලබාදුන්නද එය කඩා ඉවත් කිරීමට තීරණය වී ඇති බැවින් පවත්වාගෙන යාමට නොහැකි බව බදුකරු විසින් දන්වන ලදී. |
| (ආ) | ගවමස් කඩයෙන් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු රු. 525,146 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | කොටියාකුඹුර ගව මස් කඩය සම්බන්ධ නඩුවේ තීන්දුව අනුව බදුකරුගේ වත්කම් ඉදිරිපත් කරන ලෙස ගරු අධිකරණය විසින් නියම කළ අතර ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. මෙතෙක් ඒ පිළිබඳ අවසන් තීන්දුවක් ලබා දී නොමැත. |

2.2.3 වෙනත් ආදායම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බදු දියහැකි ඉඩම් හදුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබු අතර, ස්ථාන 12 ක එළදාව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණද ස්ථාන 06 ක් පමණක් බදු දී තිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | 2018 වර්ෂයේ එළදාව බදුදීම සඳහා ස්ථාන 12 ක් සඳහා ටෙන්ඩර් කැඳවූවත් එයින් ස්ථාන 06 ක් සඳහා ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීය. |

2.2.4 ඉඩම් විකිණීම මත බදු

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව කට්ටිකර විකුණන ලද ඉඩම්වල විකුණුම් වටිනාකම මත සියයට එකක බද්දක් අයකර ගත යුත වුවත් විකුණන ලද ඉඩම් 03 කින් තක්සේරු වටිනාකම මත පමණක් බදු අයකර තිබුණි. | පනත ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය වෙත ගොස් ලේඛන පරීක්ෂා කර නියමිත බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,687,573 ක් හා මුද්දර ගාස්තු රු. 43,154,045 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | 2018 වර්ෂයේ අගෝස්තු මාසය හැර ඉතිරි මාස සඳහාත්, 2019 පෙබරවාරි මස දක්වාත්, උසාවි දඩ උපලේඛන ලැබී ඇත. ඊට අදාල මුදල් කඩිනමින් ගෙන්වා ගැනිමට කටයුතු කරමි. 2018.12.31 දිනට හිඟ මුද්දර ගාස්තු වලින් 2017 වර්ෂයට අදාල සියලු හිඟ මුදල් හා 2018 වර්ෂයේ මැයි මාසය සඳහාත් මුද්දර ගාස්තු මේ වන විට ලැබී ඇත. ඒ.අනුව 2018 වර්ෂයට අදාල ඉතිරි මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3 . මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යයසාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුයි. | සභාව විසින් පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ඇති අතර එය මේ වන විට පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත යවා ඇත. අනෙකුත් අංශ වලට අදාලව අතුරු ව්‍යවස්ථා 16 ක් 2019 ජූලි 09 දින මහා සභා න්‍යාය පත්‍රයට ඇතුලත් කර ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉටුකිරිමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති 6 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉටු කිරීමට අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුයි. | වැසිකිළි නොමැති පවුල් 02 ක් සඳහා වැසිකිළි ලබා දීම 2018 වර්ෂයේ දී උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් ලබා දීමට අරමුණු කරගෙන තිබුණද නිසි කාලය තුල එම මුදල් නොලැබීම නිසා මෙම කාර්යය ඉටු කිරීමට නොහැකි විය. අනෙක් කරුණු කෙරෙහි ඉදිරියේදී අවධානය යොමු කරමි. |

(ඇ) අතහැර දැමූ කර්තවයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුලදී ඉටු කිරීමට ගිවිසුම්ගතවී තිබූ රු. 6,272,750 ක් වටිනා කර්මාන්ත 10 ක් ඉටුනොකර අත්හැර දමා තිබුණි. | අදාළ කර්මාන්තවල වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. | මෙහි පළාත් පාලන මාර්ග සංවර්ධනය යටතේ වන කර්මාන්ත ව්‍යාපෘති වලට අදාල ගිවිසුම් අත්සන් කර ඇතත් වැඩ නිම කිරීම සිදු කර නොමැත. වේගවත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති මැයෙන් ගිවිසුම්ගත වූ / නොවූ වැඩ ආරම්භ නොකල සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස 2018 නොවැම්බර් 27 දින දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | ඇස්තමේන්තු සිදුකර තිබූ රු.1,943,750 ක් වටිනා කර්මාන්ත 07 ක් ඉටුකර නොතිබුණි. | අදාළ කර්මාන්තවල වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුයි. | බලපත්තාව කඩිගමුව මාර්ගය, මාබොඩ තෙලිඇල්ල මාර්ගය, අක්කර 10 ගෙවල් 10 මැද මාර්ගය යන සංවර්ධන ව්‍යාපෘති පිළිවෙලින් 2017.09.13, 2017.08.23 හා 2017.07.18 දිනැතිව ඇස්තමේන්තු කැඳවන ලදී. ගරු ආණ්ඩුකාරතුමාගේ 2017.10.17 දිනැති ලිපිය මගින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති එතුමාගේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් සභාව සතුව නොමැති බැවින් සේවාදායකයන්ට ගලි සේවාව ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමිවී තිබුණි. | විධිමත් අපහරණ වැඩපිළිවෙලක් සකස් කළ යුතුයි. | මේ වනවිට අප සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන්නේ වන රක්ෂණ දෙපරේතමේන්තුවට අයත් භූමියකය. එහි මේ වන විට කසල කළමනාකරණ කටයුතු සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත. එම නිසා ගලි අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා මෙම භූමිය ප්‍රමාණවත් නොවන බැවින් තවත් අක්කර 02 ක ප්‍රමාණයක් සඳහා වන රක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් තර ඇත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ කෙටිකාලීන වැඩසටහන් කිහිපයක් ඉටුකර තිබුණද, දිගුකාලීන සැලසුම් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. | 2019-2021 දක්වා සිව් අවුරුදු සැලැස්මෙහි තිරසාර අරමුණු ළඟා කර ගැනීමට අදාල ව්‍යාපෘති ඇතුලත් කර ඇති බව දන්වන අතර එහි පිටපත් 2019 මාර්තු 15 දිනැතිව ඔබ වෙත යොමු කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පවතින ද්විතීක මට්ටමේ පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුයි. | පුරප්පාඩු පිළිබඳ මාසිකව පලාත් පාලන සහකාර කොමසාරිස් සහ පලාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දී ඇත. |

නොතිබූ අතර වෙනත් දෙපාර්තමේන්තු වලින් අනුයුක්ත කර තිබූ සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2052 දරන ගැසට් නිවේදනය මඟින් සංවර්ධනය නොකල ඉඩම් වල ප්‍රාග්ධන වටිනාකමින් සියයට 2 ක් නොඉක්මවන බද්දක් අයකර ගැනීමට අපේක්ෂා කළද එවැනි ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | මෙම සභාව සඳහා ආදායම් පරීක්ෂක තනතුරු 03ක් අනුමතව ඇතත්, 2018 වර්ෂයේ සේවයේ යෙදී සිටින්නේ එක් නිළධාරියකු පමණි. එබැවින් සියළුම ආදායම් එක්රැස් කිරීම එම නිළධාරියාට පැවරී ඇති බැවින් මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීමට නොහැකි විය. මෙම වර්ෂයේදී ඒ පිළිබඳ සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම් ගොඩනැගිලි පැහැදිලිව හඳුනා ගැනීම සඳහා ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකර වටිනාකම තක්සේරු කර ලේඛනගත කර නොතිබුණි. | සභාව සතු ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ලේඛණගත කිරීමට ක්‍රියාකළ යුතුයි. | ස්ථාවර වත්කම් පැහැදිලිව හඳුනාගෙන එම වත්කම් නව වෙළඳපොල වටිනාකමට තක්සේරු කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලියා පදිංචි අයිතිය වෙනත් රාජ්‍ය ආයතනයක් සතු වූ රු.6,221,373 ක් වටිනා වාහනයක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. | 2019 පෙබරවාරි 01 දින පරිත්‍යාග ලෙස ලද WP ZB 0329 දරන කම්පැක්ටරයේ අයිතිය සභාව වෙත පවරා ගැනීට කටයුතු කරමි. |

3.4.3 නිශ්ක්‍රීය /ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 ජූනි මස සිට ධාවනයෙන් ඉවත්කර තිබූ ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කිරීමට හෝ ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු ප්‍රයෝජනයට නොගන්නා වත්කම් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. | අංක 37-9574 දරන ට්‍රැක්ටර් රථය 1991 වර්ෂයේ දී සභාව වෙත ලැබී ඇත.අවු.28 ක් පමණ ධාවන කටයුතු සිදු කල රථයකි. මේ වන විට ධාවනයට නුසුදුසු තත්වයේ පවත්නා බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 හි සඳහන් ආකාරයට ඉදිරියේදී අපහරණය කිරීමට නියමිතය. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර වර්ෂය තුලදී රු. 4,438,570 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුයි. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් නොතිබුනද එම වර්ෂයේ අයවැය ප්‍රතිපාදන තුල කාර්යාලයට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගෙන ඇතත් 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

4 . ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 (මූල්‍ය හා පරිපාලන) රීති 168(1) ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඊලඟ වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ක්‍රියාකළ යුතුයි. | පිළිතුරු ලබා දී නැත |

4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 24 ක එකතුව වූ රු.4,048,500 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා වැය විෂයයන් 10 ක එකතුව රු.3,046,000 ක් වූ ප්‍රතිපාදන වලින් සියයට 50 ත් සියයට 88 ත් අතර පරාසයක උපයෝජනය කර නොතිබුණි. | අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුයි. | 2018 ගිණුම් වර්ෂයේ දී අපේක්ෂිත උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම නොලැබීම නිසා අපේක්ෂිත සැලසුම් සඳහා වියදම් කිරීමට නොහැකි වූ අතර වැය විෂයයන් වල ප්‍රතිපාදිත ප්‍රමාණයන් වැය කිරීමට නොහැකි විය. |

4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණනය සඳහා සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි ඇතුලත් කරුණු ප්‍රමාණාත්මකව පරීක්ෂාකර නොතිබුණි. | සැලැස්මට අනුව අභ්‍යන්තර විගණනය සිදුකළ යුතුයි. | 2019 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

4.4 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා එක් විගණන කළමනාකරණ රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා සාර්ථක අභ්‍යන්තර පාලනයක් පවත්වාගත යුතුයි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් 1/2018/14 හා 2018.10.19 දිනැති විගණන හා කළමනාකරන කමිටු පිහිටුවීම සම්බන්ධ උපදෙස් වලට අනුව 2018 වසෙර් 4 වැනි කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා ඇති අතර 2019 වර්ෂයට කාර්තුවකට 01 බැගින් මේ වන විට කමිටු 02 ක් පවත්වා ඇත. |